


**37 වන පිටෙන්**

කාලතුවක්කු ප්‍රහාරවලින් පරන්තන් ප්‍රදේශය දෙදරුම් කන්නට විය. ස්වයං ආරක්ෂාව සළසා ගැනීම ගැන පවා නොදැන සිටින නවක සටන්කාමීන්ව තව දුරටත් එම ස්ථානයෙහි රඳවා තබා ගැනීම ඥානාන්විත නොවන බව මම අවබෝධ කරගත්තෙමි. භාරකරුගේ අවසරයෙන් තොරව මම ක්ෂණික තීරණයක් ගත යුතු තත්වයෙහි සිටියෙමි. නවක සටන්කාමීන්ගේ ජීවිතවලට හානියක් සිදුවුවහොත් මම ගත් තීරණය සඳහා නායකත්වය විසින් දෙනු ලබන දඬුවමට මුහුණ දීමට මට සිදුවන බව මම හොඳින් දැන සිටියෙමි. එහෙත් එම සටන්කාමීන්ගේ ජීවිත ආරක්ෂා කරගැනීමේ අරමුණින් මම එම හිතුවක්කාර තීරණය ගත්තෙමි.

මූලික පුහුණු කඳවුර පරිපාලනය භාරගෙන නොතිබූ හෙයින් පුහුණු නිල ඇඳුම් පවා එම සටන්කාමීන්ට ලබා දී තිබුණේ නැත. ඔවුහු නිවෙස්වල සිට පැමිණි ඇඳුම් පිටින්ම සිටියහ. එය සවස් කාලයයි. එහෙයින් ඔවුන්ව එම ස්වරූපයෙන් පාර දිගේ කැඳවාගෙන යෑම ප්‍රශ්නයක් නොවනු ඇතැයි සිතුවෙමි. එහෙයින් මගේ කණ්ඩායමේ සිටි සටන්කාමීන් විසි දෙනා ද ඔවුන් සමඟ එක්කර කුඩා කණ්ඩායම්වලට බෙදුවෙමි. මෙම අර්බුධකාරී අවස්ථාවෙහි දී වාහන බලාපොරොත්තුවෙන් කාලය නාස්ති කළ නොහැකිය. එහෙයින් පා ගමනින්ම ඔවුන්ව කැඳවාගෙන යන තීරණයට පැමිණ වටාටක්කචාචි මහා විද්‍යාලයට ඉදිරියෙන් ඇති මාර්ගයෙහි ඔවුන්ව කුඩා කණ්ඩායම් ලෙස ගමන් කිරීමට සලස්වා ඉරණමඩු වැව් බැම්මට පහළින් ඇති ප්‍රදේශයෙන් පාර මාරුවී ඉරණමඩු හන්දියට පැමිණියෙමු. එයට පසුව අපි ඒ 9 මාර්ගය දිගේ මුරිකණ්ඩි ප්‍රදේශය කරා ඉදිරියටම ගමන් කරන්නට වීමු. මුරිකණ්ඩිය නම් වූ ස්ථානයට ළඟා වූ පසුව ඒ 9 මාර්ගයෙන් ඉවත් වී කාලතුවක්කු ප්‍රහාර එල්ල නොවන අක්කරායෙන් වනගත ප්‍රදේශයට කැලෑ පාරවල්වලින් ළඟා විය හැකිය යන අරමුණෙන් අපි ගමන් කළෙමු. නවක සටන්කාමීහු දුවමින් ද වේගයෙන් ගමන් කරමින් ද පැමිණි හෙයින් දහදියෙන් නැහැවී වෙහෙසට පත්ව උන්හ. ළඟ ළඟම කාල තුවක්කු උණ්ඩ වැටී පුපුරා යන්නට වූයෙන් ඔවුන්ගෙන් බහුතරය තැතිගැන්මට ලක්ව උන්හ. මුරිකණ්ඩි හන්දියේ සිට අක්කරායන් කරා යන මාර්ගය ඔස්සේ යුනියන් වැව ආසන්නයට පැමිණි අපි දේශපාලන අංශයෙහි කාන්තා අංශයට අයත් පිරිසක් පාර අයිනේ මඩුවක් තනා තිබෙනු අහම්බෙන් දුටුවෙමු. මා හොඳින් දන්නා හඳුනන විනෝ නම් සටන්කාමී සහෝදරිය එම කඳවුර භාරව සිටියාය. මම ඇයගේ සහයෝගයෙන් මඳක් ආරක්ෂා සහිත වූ කැළෑ ප්‍රදේශයක එම නවක සටන්කාමී සහෝදරියන්ට රාත්‍රිය ගත කිරීමට සැලැස්සුවෙමු. ආසන්න ප්‍රදේශයෙහි පදිංචිව සිටි ජනයාගේ උපකාරයෙන් විනෝ එදින අපට රාත්‍රී ආහාර සපයා දුන්නාහ.

පසු දින උදයේ අපගේ දේශපාලන අංශයේ කාන්තා අංශය භාර ලුතිතන් කර්නල් ධාරණී එම ස්ථානයට පැමිණියාය. නවක සටන්කාමී සහෝදරියන්ව මූලික පුහුණු කඳවුරට යැවීම සඳහා ඇය කටයුතු කළාය. එමෙන්ම අපගේ අධ්‍යාපන අංශය සඳහා ආරක්ෂිත කඳවුරක් සකස් කරන බව දැනුම් දුන්නාය. පෙරදින රාත්‍රියෙහි සිදුවූ ගැටුම්වලට පසුව හමුදාව පරන්තන් ප්‍රදේශයෙහි සමහර ස්ථාන අත්පත් කරගෙන ඇති බවත් ඇය ප්‍රකාශ කළාය. එයට පසුව වට්ටක්කච්චි ගොවිපල පිහිටි ප්‍රදේශයට නැවත යා හැකි වූයේ නැත. එය ජන ශුන්‍ය ප්‍රදේශයක් බවට පත්ව තිබුණි. වන්නියෙහි යම් කිසි ස්ථානයක් වාසස්ථානයක් බවට පත් කර ගැනීමට නම් එම ප්‍රදේශයේ භූගෝලීය සැකස්ම පිළිබඳව පූර්ණ දැනුමක් තිබීම අත්‍යාවශ්‍ය සාධකයෙකි. මක්නිසාද යත් සමහර ස්ථානවල ජල සම්පත ප්‍රමාණවත් අයුරින් පවතින අතර, සමහර ස්ථානවල එසේ නොමැත. සමහර ස්ථාන කොතරම් ගැඹුරට ළිං හෑරුවත් වතුර බිඳක්වත් දැක ගැනීමට නොලැබෙයි. එපමණක් නොව, නියං කාලයට වියළී ගොස් පවතින සමහර පෙදෙස් වැසි කාලයට වැසි දිය පිරී වැවක් සේ දිස්වෙයි. මමත් අධ්‍යාපන අංශයේ පිරිමි පාර්ශ්වයෙහි භාරකරුත් එක්ව කොල්ලර් පුලියංකුලම් නම් වූ ගමෙහි ස්ථානයක් තෝරා ගත්තෙමු. එය වනගත ප්‍රදේශයක් වුවත්, මහත් රුක්ෂ වනයක් නොවීය. එය තැනින් තැන විශාල ගස් සහ යටි වැස්මක් සහිත පඳුරුවලින් ද යුක්ත විය. තැනින් තැන බැම් සහිත ළිං විය. එම ළිංවලට ආසන්නයේ අපි අපගේ කඳවුරු පිහිටුවා ගත්තෙමු. අවට ජනාවාස කිසිවක් නොවීය. ආසන්නයේ වූ කුඩා කෝවිලේ පූජාව පවත්වන පූජක පවුල පමණක් එම ස්ථානයේ වාසය කළේය. විශාල එළවළු වත්තක් සහ ගවයන් විශාල සංඛ්‍යාවක් ඔහු සතු විය. ඔහු එම ප්‍රදේශය පිළිබඳ තොරතුරු මැනවින් දැන සිටියේය. දුර ප්‍රදේශවල සිට ජනයා අංජනම් බැලීමටත්, ආරක්ෂක ගුරුකම් කරගැනීමටත් ඔහු වෙත පැමිණියහ. අතීතයේ පිට ගම්වල සිට පැමිණි ජනතාව එම ප්‍රදේශයේ විවිධ වගාවන්හි නියුතු වූ බව ඔහු සඳහන් කළේය.

දිනක් උදෑසන අපි අපගේ කඳවුර ආසන්නයේ තැනිතලාවෙහි ශාරීරික අභ්‍යාස කරමින් උන්නෙමු. අප සිටි ස්ථානය ආසන්නයේ දහ දොළොස් දෙනෙකුගෙන් යුතු මුව රංචුවක් කිසිදු බියක් සැකක් නොමැතිව ඇවිදිමින් උන්නේය. ශාඛා බෙදුණු අං තට්ටුවලින් යුතු වූ සුන්දරත්වය සහ ශාන්ත බවින් පිරුණු එම තිත් මුවන්ගේ දර්ශනයෙන් අපි සියලු දෙනාම වශීකෘතව උන්නෙමු. උන්ට බාධාවක් නොවන ලෙසින් අපි අපගේ අභ්‍යාස මඳ වේලාවකට නවතා එම දර්ශනය නැරඹුවෙමු. එම මොහොතේ අපි මෙම ලෝකයම අමතකව යන ආනන්දයක ගැලී සිටියෙමු. මෙය අපි අපේ සටන්කාමී සහෝදරියන් සමඟ පැවසුවෙමු. 'ෂහ්, කොයිතරම් හොඳ අවස්ථාවක්ද? එකෙකුට හරි වෙඩි තිබ්බ නම් මස් ටිකක් කන්න තිබුණානේ' යැයි ඔවුහු කීහ. ''ඔයාටල ඉතිං හැම තිස්සෙම හිතේ තියෙන්නේ කෑම, කෑම'' යැයි පවසමින් අපේ සටන්කාමී සහෝදරියෝ ඔවුන් සමඟ වාද කරන්නට වූහ.

**-මතු සම්බන්ධයි-**




**Share accommodation available**
for uni student
in Glen Waverley central.

Call Sidani
0432625528

**A van for hire**
(Nissan elgrand)

Call Sidani
0432625528

**Aged care**
during day time only.
Day care
for your older parents
at our home.

Please call Sidani
0432625528